සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Sabaragamuwa Provincial Department of Education

අවසාන වාර පරීක්ෂණය - 2026 - 13 ශ්‍රේණිය
**Final Term Test – 2026 – Grade 13**

ව්‍යාපාර අධ්‍යයනය - I
Business Studies - I

32 S I

කාලය } පැය දෙකයි.
Time } Two hours

විභාග අංකය:.............................

උපදෙස් :

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම සපයන්න.
- ප්‍රශ්න අංක 1 සිට 30 තෙක් වූ ප්‍රශ්න වලට නිවැරදි පිළිතුරු තෝරා, එහි අංකය ප්‍රශ්නය ඉදිරියෙන් ඇති තිත් ඉරමත ලියන්න.
- ප්‍රශ්න අංක 31 සිට 50 තෙක් වූ ප්‍රශ්න වලට කෙටි පිළිතුරු අදාළ තිත් ඉරිමත ලියන්න.
- සෑම ප්‍රශ්නයකටම ලකුණු දෙක බැගින් හිමි වේ.

---

**01.** පහත දැක්වෙන්නේ අවශ්‍යතා හා වුවමනා වල ලක්ෂණ කිහිපයකි.

A – අත්‍යවශ්‍යයෙන්ම සපුරා ගත යුතුය
B – ව්‍යාපාරිකයාට නිර්මාණය කළ හැක.
C – අසීමිත බව
D – සෑම පුද්ගලයාටම පොදුය.
E – පුද්ගල බද්ධය
F – සීමිත බව
G – පුද්ගලයාගෙන් පුද්ගලයාට විවිධය
H – සමාජ බලවේග මගින් වෙනස් කළ නොහැක.

ඉහත දෑ අතුරින් අවශ්‍යතාවල ලක්ෂණ පමණක් ඇතුළත් වරණය වන්නේ,

(1) A, C, F, H (2) A, D, F, H (3) B, C, E, G
(4) C, D, F, G (5) B, D, E, F (……)

**02.** ඉහත ප්‍රකාශ අතුරින් වඩාත් නිවැරදි ප්‍රකාශය වන්නේ කුමක්ද?

(1) ස්වයං පෝෂිත අර්ථ ක්‍රමයේදී වෙළෙඳාම බිහිවීම සිදුවිය.
(2) ස්වයං පෝෂිත අර්ථ ක්‍රමයේදී සෘජු නිෂ්පාදනය සිදු විය.
(3) කාර්මික විප්ලවයේ ප්‍රතිඵලයක් ලෙස මුදල් භාවිතයට පැමිණීම සිදු විය.
(4) සෘජු නිෂ්පාදනයේ වර්ධනය සමඟ මුදල් භාවිතයට පැමිණීම සිදු විය.
(5) භාණ්ඩ හුවමාරු අදියරේදී විද්‍යුත් වාණිජ්‍ය භාවිතයට පැමිණීම සිදු විය. (…….)

**03.** පහත දැක්වෙන්නේ ව්‍යාපාර පිළිබඳ උනන්දුවන පාර්ශව කිහිපයක් හා උනන්දු වීමට හේතු කිහිපයකි.

| පාර්ශව | උනන්දුවීමට හේතු |
|---|---|
| (1) අයිතිකරුවෝ | A. ව්‍යාපාරයේ වර්ධනය දැන ගැනීමට |
| (2) කළමණාකරුවෝ | B. රැකියාවේ උසස්වීම් ලබා ගැනීමට |
| (3) සේවකයෝ | C. තම ණය මුදලේ සුරක්ෂිතබව දැන ගැනීමට |
| (4) ණය හිමියෝ | D. ලාභය උපරිම කිරීමට |


www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

ඉහත පාර්ශව හා උනන්දුවීමට හේතු වඩාත් නිවැරදිව ගලපා ඇති පිළිතුර වන්නේ,

(1) D,A,B,C (2) C,A,B,D (3) D,B,A,C
(4) A,D,B,C (5) C,D,B,A (……)

**04.** ව්‍යාපාරයක් එහි ගනුදෙනුකරුවන්ට ආචාරධර්ම ඉටු කිරීම සඳහා කළ යුතු වන්නේ,

(1) ව්‍යාපාරයේ මූල්‍ය අක්‍රමිකතා හා වංචා පිටු දැකීමය.
(2) සාධාරණව තරඟකාරීත්වයට මුහුණ දීමටය.
(3) ගුණාත්මක භාණ්ඩ හා සේවා සැපයීමටය.
(4) සේවක අයිතීන් සුරකීම
(5) නව වෙළෙඳපොළවල් කරා භාණ්ඩ යොමු කිරීම. (…….)

**05.** පහත දැක්වෙන්නේ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක බදු වර්ග කිහිපයකි.

A – පුද්ගල ආදායම් බදු
B – එකතු කළ අගය මත බදු
C – රඳවා ගැනීමේ බදු
D – ප්‍රාග්ධන ලාභ මත බදු
E – රේගු බදු
F – සමාගම් බදු
G – නිෂ්පාදන බදු

ඉහත බදු වර්ග අතුරින් ඍජු බදු පමණක් ඇතුළත් වරණය වන්නේ,

(1) A,B,D,F (2) B,D,F,G (3) A,C,D,F
(4) B,C,F,G (5) C,D,E,F (…….)

**06.** පහත දැක්වෙන්නේ හවුල් ව්‍යාපාර සම්බන්ධයෙන් ඉදිරිපත්වී ඇති ප්‍රකාශ දෙකකි.

A – 1890 හවුල් ව්‍යාපාර ආඥාපනතේ 24 වන වගන්තියේ විධිවිධාන මත පමණක් හවුල් ව්‍යාපාරය පවත්වා ගත යුතුය.

B – හවුල් ඔප්පුවක හවුල් ව්‍යාපාරය සම්බන්ධ මූලික තොරතුරු ඇතුළත් වේ.

ඉහත තොරතුරු සම්බන්ධ වඩාත් නිවැරදි ප්‍රකාශය වන්නේ,

(1) A පමණක් නිවැරදිය
(2) B පමණක් නිවැරදිය
(3) A හා B ප්‍රකාශ දෙකම නිවැරදිය.
(4) A හා B ප්‍රකාශ දෙකම වැරදිය.
(5) A ප්‍රකාශය මගින් B ප්‍රකාශය පැහැදිලි කරයි. (…….)

**07.** පහත දැක්වෙන්නේ ව්‍යාපාර සංවිධාන පිළිබඳ ප්‍රකාශ කිහිපයක් වේ.

A – අයිතිකරු විසින් පාලනය කරයි.

B – ඡන්දයෙන් පත් වූ අධ්‍යක්ෂවරු විසින් පාලනය කරයි.

C – ප්‍රජාතන්ත්‍රවාදී සාමාජික පාලනයක් පවතී.



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

D – රජය පත්කරන අධ්‍යක්ෂක මණ්ඩලයක් මගින් පාලනය කරයි.

E – අමාත්‍යාංශයේ සෘජු පාලනයට යටත්වේ.

ඉහත ප්‍රකාශ සඳහා ගැලපෙන ආයතන නිවැරදිව පෙළගස්වා ඇති පිළිතුර වන්නේ,

(1) සමූපකාර, සංස්ථාපිත සමාගම්, කේවල ස්වාමි ව්‍යාපාර, රාජ්‍ය දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා

(2) කේවල ස්වාමි ව්‍යාපාර, සංස්ථාපිත සමාගම්, සමූපකාර, රාජ්‍ය දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා

(3) කේවල ස්වාමි ව්‍යාපාර, සංස්ථාපිත සමාගම්, සමූපකාර, රාජ්‍ය සංස්ථා, රාජ්‍ය දෙපාර්තමේන්තු

(4) සංස්ථාපිත සමාගම්, කේවල ස්වාමි ව්‍යාපාර, සමූපකාර, රාජ්‍ය සංස්ථා, රාජ්‍ය දෙපාර්තමේන්තු

(5) සංස්ථාපිත සමාගම්, සමූපකාර, කේවල ස්වාමි ව්‍යාපාර, රාජ්‍ය සංස්ථා, රාජ්‍ය දෙපාර්තමේන්තු

(…….)

**08.** ව්‍යවසායකත්ව ක්‍රියාවලියේ පියවර නිවැරදිව දැක්වෙන පිළිතුර ඇතුළත් වරණය තෝරන්න.

(1) සංකල්ප ගොඩනැගීම හා සැලැස්ම සැකසීම → නව්‍යතා සොයා ගැනීම → සම්පත් සම්පාදනය → ප්‍රතිලාභ ලැබීම → යථාර්ථයක් බවට පත් කිරීම.

(2) සම්පත් සම්පාදනය → සංකල්ප ගොඩනැගීම හා සැලැස්ම සැකසීම → නව්‍යතා සොයා ගැනීම → ප්‍රතිලාභ ලැබීම → යථාර්ථයක් බවට පත් කිරීම.

(3) සම්පත් සම්පාදය → සංකල්ප ගොඩනැගීම හා සැලැස්ම සැකසීම → ප්‍රතිලාභ ලැබීම → යථාර්ථයක් බවට පත් කිරීම → නවෝත්පාදනය

(4) නව්‍යතා සොයා ගැනීම → සම්පත් සම්පාදනය → සංකල්ප ගොඩනැගීම හා සැලැස්ම සැකසීම → යථාර්ථයක් බවට පත් කිරීම → ප්‍රතිලාභ ලැබීම

(5) නව්‍යතා සොයා ගැනීම → සංකල්ප ගොඩනැගීම හා ව්‍යාපාර සැලැස්ම සැකසීම → අවශ්‍ය සම්පත් සම්පාදනය → යථාර්ථයක් බවට පත් කර ගැනීම → ප්‍රතිලාභ ලැබීම. (…….)

**09.** පහත දැක්වෙන්නේ විශේෂිත මූල්‍ය ආයතන වල කාර්යයන් කිහිපයක් හා ඊට සම්බන්ධ පාර්ශව කිහිපයකි.

| කාර්යය | පාර්ශවය |
|---|---|
| A. වෙළෙඳ ආයතන ගනුදෙනුකරුවන්ට සැපයූ ණය අය කිරීම සහ මිලදී ගැනීම සිදු කරයි. | 1. ප්‍රාථමික අලෙවිකරුවන් |
| B. නව ව්‍යවසායකයින්ට අවශ්‍ය ප්‍රාග්ධන සපයයි. | 2. ප්‍රාරක්ෂකයින් |
| C. සමාගම මහජනයාට කරන සුරකුම් නිකුතුවකදී අලෙවි නොවූ සුරකුම් මිලට ගැනීමට ගිවිස ගනී. | 3. ආන්තික සැපයුම්කරුවන් |
| D. රජයේ සුරකුම් මිලට ගෙන ද්විතික වෙළෙඳපොළේ අලෙවි කරයි. | 4. ව්‍යවසායක ප්‍රාග්ධන සමාගම් |

ආයතන වල කාර්යය හා පාර්ශව නිවැරදිව ගළපා ඇති පිළිතුර වන්නේ,

(1) A3, B2, C4, D1 (2) A2, B4, C1, D3 (3) A4, B3, C2, D1

(4) A1, B4, C2, D3 (5) A3, B4, C2, D1 (…….)



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

**10.** පහත දැක්වෙන්නේ බැංකු ගිණුම් පිළිබඳ ඉදිරිපත් වී ඇති ප්‍රකාශ කිහිපයකි.

A – ජංගම ගිණුම් පවත්වාගෙන යයි. B – බැංකු ප්‍රකාශයක් ලබයි.

C – සමාගම් කොටස් ප්‍රාරක්ෂණ කටයුතු කරයි. D – ස්ථාවර තැන්පතු පවත්වාගෙන යයි.

E – ඉතුරුම් තැන්පතු පවත්වාගෙන යයි. F – කල්බදු පහසුකම් සපයයි.

G – අයිරා පහසුකම් සපයයි.

ඉහත ප්‍රකාශ අතුරින් බලපත්‍ර ලාභී විශේෂිත බැංකුවල කාර්යය පමණක් ඇතුළත් පිළිතුර වන්නේ,

(1) A, B, C, D (2) A, C, D, E (3) C, D, E, F

(4) B, C, F, G (5) D, E, F, G (……)

**11.** තේ කර්මාන්ත ශාලාවක් සඳහා ගිනි හා සොරබිය රක්ෂණාවරණයක් ලබා ගැනීමේ අරමුණ වන්නේ,

(1) අවදානම වැඩි කර ගැනීමය. (2) අවදානම අවම කර ගැනීමය.

(3) අවදානම භාර ගැනීමය. (4) අවදානම විතැන් කිරීමය.

(5) අවදානම පාලනය කිරීමය. (…….)

**12.** නුවරඑළිය ප්‍රදේශයේ සිට දුම්රිය මාර්ග හරහා විශේෂිතව සැකසූ දුම්රිය මැදිරි සහිත දුම්රිය යොදාගෙන කොළඹට මල් ප්‍රවාහනය කිරීමට නියමිත වුවත් ප්‍රමිතියෙන් තොර ගල් අඟුරු භාවිතය හේතුවෙන් ඇති වූ කාර්මික දෝෂයක් නිසා දුම්රිය ස්ථානය වෙත පැමිණීම ප්‍රමාද විය.

ඉහත සිද්ධියට අනුව ප්‍රවාහනයේ මූලිකාංග පිළිවෙලින් දක්වා ඇති පිළිතුර වන්නේ,

(1) මාර්ගය, බලය, මාධ්‍යය, පර්යන්තය (2) මාර්ගය, මාධ්‍යය, බලය, පර්යන්තය

(3) පර්යන්තය, මාධ්‍යය, බලය, මාර්ගය (4) මාධ්‍යය, මාර්ගය, පර්යන්තය, බලය

(5) බලය, මාර්ගය, මාධ්‍යය, පර්යන්තය (…….)

**13.** පහත දැක්වෙන්නේ සන්නිවේදන ආකාර කිහිපයකි.

A – අණ බෙර B – E – mail C – දැන්වීම් පුවරු

D – SMS සේවාව E – නිවේදන පොත F – දුරකථන

G – ශබ්ද විකාශන යන්ත්‍ර H– Whatsapp පණිවුඩ

ඉහත සන්නිවේදන ආකාර අතරින් පණිවුඩය යවන්නාට,පණිවුඩය යැවූ බවට සාක්ෂිලෙස තබා ගත හැකි සන්නිවේදන ආකාර ඇතුළත් වරණය වන්නේ,

(1) A, C, F, G (2) A, B, C, D (3) E, D, F, H

(4) B, D, E, H (5) D, E, F, G (……)

**14.** ප්‍රධානියා වෙනුවෙන් භාණ්ඩ මිලදී ගැනීමේ දී එම ගනුදෙනු තම පෞද්ගලික නමින්ම සිදු කරනු ලබන නියෝජිතයා වන්නේ,

(1) සාධ්‍යකයා (2) කොමිස් නියෝජිතයා (3) කැපකාර නියෝජිතයා

(4) තැරැව්කරුවා (5) වෙන්දේසිකරුවා (…….)



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

**15.** පහත දැක්වෙන්නේ විදේශ වෙළෙඳාමේ ප්‍රභේද කිහිපයක් හා ඒ සම්බන්ධ ප්‍රකාශ කිහිපයකි.

| | |
|---|---|
| 1. ආනයන වෙළෙඳාම | A. යම් රටකින් ගෙන්වන ලද ද්‍රව්‍ය රටතුලට ගෙන වෙනසකට ලක් කර හෝ නොකර නැවත යැවීම. |
| 2. අපනයන වෙළෙඳාම | B. යම් රටක් තවත් රටකින් හෝ රටවලින් භාණ්ඩ ගෙන්වීම. |
| 3. ප්‍රති අපනයන වෙළෙඳාම | C. යම් රටක් විදේශ රටකට හෝ රටවලට භාණ්ඩ යැවීම. |
| 4. අන්තරාල වෙළෙඳාම | D. විදේශයන්ගෙන් ගෙන්වන ද්‍රව්‍ය රටතුලට නොගෙන වරාය තුළ සකසා හෝ සැකසීමකින් තොරව නැවත රටවලට යැවීම. |

එම වෙළෙඳ ප්‍රභේද හා අදාළ කරුණු නිවැරදිව ගැලපූ පසු පිළිතුර වන්නේ,

(1) B, C, A, D (2) B, C, D, A (3) C, A, D, B
(4) C, B, D, A (5) A, D, C, B (……)

**16.** ඊයේ දිනට ඇමරිකානු ඩොලරයක විකුණුම් මිල රු.338.93 ක එහි ගැනුම් මිල රු.337.85 කි. එය අද දිනට විකුණුම් මිල රු. රු.339.93 කි. එහි ගැණුම් මිල රු.338.73 කි. මේ හේතුවෙන්,

(1) ආනයනික භාණ්ඩ ඇණවුම් වැඩි වෙ. (2) අපනයන භාණ්ඩ ඇණවුම් වැඩි වේ.
(3) අපනයන මිළ වැඩි වේ. (4) ආනයන භාණ්ඩ මිල අඩුවේ.
(5) අපනයන අඩු වේ. (…….)

**17.** භාණ්ඩයක ගුණත්ව අංගෝපාංගයකි.

(1) ශුන්‍ය දෝෂ (2) ගුණත්ව ප්‍රමිති (3) මනා ක්‍රියාකාරිත්වය
(4) තත්ත්ව කව (5) තත්ත්ව පාලනය (…….)

**18.** ඛණිජ තෙල් අර්බුධය නිසා හැකි සෑම පාරිභෝගිකයෙක්ම තමාට අවශ්‍ය භාණ්ඩ හා සේවා මංගත ක්‍රමයට ඇණවුම් කර ලබා ගැනීම කෙරෙහි අවධානය යොමු කරන ලෙස රජය මහජනයාගෙන් ඉල්ලා සිටී.

මෙයින් අදහස් වන්නේ,

(1) මහජනයා නව තාක්ෂණයට අනුගත විය යුතු බවයි.
(2) මංගත වෙළඳාම දියුණු කළ යුතු බවයි.
(3) සැලසුම් සහගතව වැඩ කළ යුතු බවයි.
(4) වෙනස්වන පරිසරයට අනුගත විය යුතු බවයි.
(5) රජය මැදිහත් විය යුතු බවයි. (…….)

PAST PAPERS WIKI



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

**19.** නිෂ්පාදන ක්‍රම හා එයින් කෙරෙන කාර්ය කිහිපයක් පහතින් දී ඇත.

| **නිෂ්පාදන ක්‍රමය** | **කාර්යය** |
|---|---|
| a) පරිගණක ආධාරක නිර්මාණකරණය | **1.** නිර්මාණ ශිල්පියා විසින් අදාළ පරිගණක වැඩසටහන ඇසුරින් මෝස්තර සකසයි. |
| b) පරිගණක ආධාරක නිෂ්පාදන ක්‍රමය | **2.** නිෂ්පාදනාගාරයේ යන්ත්‍රවල ක්‍රියාකාරිත්වය පරිගණක මගින් පාලනය කිරීම සිදු වේ. |
| c) පරිගණක සමෝධානිත නිෂ්පාදනය | **3.** තනි පුද්ගලයෙකුට වුවද කර්මාන්ත ශාලාවක් නියාමනය කළ හැකිය. |
| d) පරිගණක අංකිත පාලනය | **4.** නිතර නිතර කළ යුතු දෘඩ කාර්යයන් සඳහා ද ඉතා සියුම් නිෂ්පාදන කාර්යයන් සඳහාද යොදා ගනී. |

දී ඇති නිෂ්පාදන ක්‍රමය අනුව කාර්යය ගැලපූ විට පිළිතුර වන්නේ,

(1) a1, b2, c3, d4 (2) a1, b3, c2, d4 (3) a1, b4, c3, d2

(4) a1, b3, c4, d2 (5) a1, b4, c2, d3 (……)

**20.**

| **භාණ්ඩ වර්ගය** | **නිදසුන්** |
|---|---|
| A. සාප්පු භාණ්ඩ | 1. මෝටර් රථ, ස්වර්ණාභරණ |
| B. පාරිභෝගික භාණ්ඩ | 2. අලුත් පොත්, විශේෂිත රෝග සඳහා ඖෂධ |
| C. විශේෂිත භාණ්ඩ | 3. වාහන නිෂ්පාදිත උපාංග, යන්ත්‍ර සූත්‍ර |
| D. නොසෙවූ භාණ්ඩ | 4. විදුලි උපකරණ, ගෘහ භාණ්ඩ |
| E. කාර්මික භාණ්ඩ | 5. පුවත්පත්, සහල් |

භාණ්ඩ වර්ගය සඳහා නිදසුන් නිවැරදිව ගැලපූ විට පිළිතුර වන්නේ,

(1) A1, B2, C3, D4, E5 (2) A4, B5, C3, D1, E2 (3) A4, B5, C1, D2, E3

(4) A1, B3, C4, D2 ,E5 (5) A1, B2, C4, D3, E5 (…….)

**21.** ජංගම දුරකථනයක් ඇත්තේ පණිවුඩ හුවමාරු කර ගැනීමටය. එය යම් අවස්ථාවක නාද වන විට හිමිකරු වෙත ආකර්ශනය වන සේ නිපදවීමට හැකිවන්නේ නම් එය භාවිතාකරන්නාට වඩාත් පහසුවේ. මෙහි ඇතුළත් වන්නේ නිෂ්පාදිතයක කුමන මට්ටම පිළිබඳවද?

(1) අපේක්ෂිත නිෂ්පාදිතය හා වැඩි දියුණු කළ නිෂ්පාදිතය

(2) විභව නිෂ්පාදිතය හා අපේක්ෂිත නිෂ්පාදිතය

(3) හර ප්‍රතිලාභය හා අපේක්ෂිත නිෂ්පාදිතය

(4) වැඩි දියුණු කළ නිෂ්පාදිතය හා මූලික නිෂ්පාදිතය

(5) හර ප්‍රතිලාභය හා විභව නිෂ්පාදිතය (…….)



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

**22.** සිලෝන් මිල්ක් සමාගම තම කිරිපිටි සුළං නොවදින සේ පොලියුරතීන් කවර වල බහා හොඳින් සීල්කර පෙට්ටි වල බහා පෙට්ටි 100ක් දැමිය හැකි විශාල පෙට්ටි වල අසුරා ලොරි රථ වලින් රට පුරා බෙදා හරියි. මෙම විස්තරයේ ඇතුළත් තොරතුරු වලින් වඩාත් පැහැදිලි වන්නේ,

(1) ඇසුරුමේ යෝග්‍යතාව පිළිබඳවයි.

(2) නිෂ්පාදිතයේ ස්වාභාවය පිළිබඳවයි.

(3) ඇසුරුමෙන් වෙළෙන්දාට පහසුවක් වන බවයි.

(4) ඇසුරුම් වර්ග කීපයක් ඇති බවයි.

(5) ඇසුරුමේ අංග පිළිබඳවයි. (.......)

**23.** ලංකාවේ මධ්‍යම අධිවේගී මාර්ගයේ ඉදිරි ඉදිකිරීම් කටයුතු සඳහා දේශීය වශයෙන් අරමුදල් යොදා ගැනීමට රජය බලාපොරොත්තු වන්නේ නම් ඊට අරමුදල් සපයා ගත හැකි මූල්‍ය වෙළඳපොළ වන්නේ,

(1) අන්තර් බැංකු ඒක්ෂණ ණය වෙළඳපොළයි. (2) දේශීය විදේශීය විනිමය වෙළඳපොළයි.

(3) භාණ්ඩාගාර බිල්පත් වෙළඳපොළයි. (4) භාණ්ඩාගාර බැඳුම්කර වෙළඳපොළයි.

(5) සාංගමික බැඳුම්කර වෙළඳපොළයි. (.......)

**24.** S & P ශ්‍රී ලංකා 20 මිල දර්ශකය අනුව සමාගම් 20 තෝරාගැනීමේ දී සළකා බලන සාධකයක් වන්නේ,

(1) සමාගමේ ප්‍රාග්ධනය (2) සමාගමේ ද්‍රවශීලතාවය (3) සමාගමේ පාලන ව්‍යුහය

(4) සමාගමේ ප්‍රාග්ධන ව්‍යුහය (5) සමාගමේ ණය ප්‍රාග්ධනය (.......)

**25.** පහත වගුවේ අයදුම්කරුවන් තෝරා ගැනීමේ ක්‍රම සහ එමගින් මැනිය හැකි ගුණාංග පිළිබඳව සඳහන් වේ.

| ක්‍රමය | මැනිය හැකි ගුණාංග |
|---|---|
| I. බුද්ධි පරීක්ෂණ | A. කාර්ය ඉටු කිරීමේ හැකියාව |
| II. සම්මුඛ පරීක්ෂණ | B. චරිතවත් බව |
| III. පසුබිම් පරීක්ෂණ | C. තනතුරට අදාළ කුසලතා සපුරා ඇති බව |
| IV. ප්‍රායෝගික පරීක්ෂණ | D. තර්කානුකූල බව |
| V. අයදුම්පත් ඇගයීම් | E. අදහස් හුවමාරුවෙන් රැකියාවට ගැලපෙන බව |

(1) I D, II E, III B, IV A, V C (2) I D, II E, III C, IV B, V A

(3) I E, II D, III B, IV A, V C (4) I D, II E, III A, IV B, V C

(5) I A, II B, III C, IV D, V E (.......)

**26.** කාර්යඵල ඇගයීමෙන් සේවාදායකයාට,

(1) සංවේතන තීරණය කළ හැකිය. (2) සේවක උසස් වීම් තීරණය කළ හැකිය.

(3) මාරු කිරීම් පිළිබඳ තීරණය කළ හැකිය. (4) ඉපයීම් ඉහළ නංවා ගැනීමට හැකිය.

(5) පුහුණු කිරීමේ අවශ්‍යතා හඳුනා ගත හැකිය. (.......)



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources

**27.** සේවක අර්ථසාධක අරමුදල සඳහා සේවකයෙකුගේ වැටුපෙන් අයකර ගන්නා ප්‍රතිශතය,

(1) 20% (2) 10% (3) 12% (4) 8% (5) 3% (.......)

**28.** පහත සඳහන් වන්නේ ව්‍යාපාර කාර්යයන් කීපයකි.

a – වෙළඳපොළ පර්යේෂණ

b – යන්ත්‍රෝපකරණ පාලනය

c – නිෂ්පාදිත සංවර්ධනය

d – විගණනය

e – කාර්යඵල ඇගයීම

ඉහත කාර්යයන් කළමණාකරන ශ්‍රිතය අනුව තොරතුරු පද්ධතිවලට වර්ග කළ විට නිවැරදි පිළිතුර වන්නේ,

(1) මෙහෙයුම්, මූල්‍ය, අලෙවිකරණ, මානව සම්පත්, පර්යේෂණ හා සංවර්ධන

(2) අලෙවිකරණ, මූල්‍ය, මානව සම්පත්, පර්යේෂණ හා සංවර්ධන, මෙහෙයුම්

(3) අලෙවිකරණ, මෙහෙයුම්, පර්යේෂණ සංවර්ධන, මූල්‍ය, මානව සම්පත්,

(4) මූල්‍ය, මෙහෙයුම්, අලෙවිකරණ, පර්යේෂණ හා සංවර්ධන, මානව සම්පත්

(5) මෙහෙයුම්, මූල්‍ය, පර්යේෂණ හා සංවර්ධන, මානව සම්පත්, අලෙවිකරණ (......)

**29.** රාජ්‍ය ආයතනයක් පිළිබඳ තොරතුරක් ලබා ගැනීමට යම් පුද්ගලයෙකුට ඇමතුම හැකි දුරකථන අංකයක් වන්නේ,

(1) 1990 (2) 1919 (3) 199 (4) 1929 (5) 1926 (.......)

**30.** සමාගමක තෝලන අනුපාතයෙන් පෙන්නුම් කරන්නේ,

(1) වත්කම් හා විකුණුම් අතර අනුපාතයයි.

(2) වත්කම් හා වගකීම් අතර අනුපාතයයි.

(3) ප්‍රාග්ධනය හා වත්කම් අතර අනුපාතයයි.

(4) මුළු ප්‍රාග්ධනය හා මුළු වගකීම් අතර අනුපාතයයි.

(5) මුළු ප්‍රාග්ධනය හා ණය ප්‍රාග්ධනය අතර අනුපාතයයි. (.......)

---

**අංක 31 සිට 40 තෙක් ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමේ දී සුදුසු වචනය/ වචන යොදා හිස්තැන් පුරවන්න.**

---

**31.** (අ) ව්‍යාපාරයක සැලසුම් සැකසීම හා තීරණ ගැනීම ............................ විසින් කරනු ලබන අතර එම සැලසුම් හා තීරණ අනුව කාර්යයන්හි නිරත වීම .................................... විසින් සිදු කරයි.

(ආ) රටවල් අතර භාණ්ඩ හා සේවා හුවමාරු වීමට ............................ බලපා ඇති අතර එයින් පුද්ගලයින්ගේ ............................ ද වෙනසකට ලක් ව ඇත.



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers • Model Answers • Study Resources
iexamhub

**32.** (අ) මෑතකදී ශ්‍රී ලංකා මහා බැංකුව මෙතෙක් පැවති ද්විත්ව පොලි අනුපාතික ක්‍රමවේදයේ සිට ............................ ප්‍රතිපත්තිමය පොළී අනුපාතයකට යොමු වූ අතර එම උපකරණය ............................ පොලි අනුපාතිකය ලෙස හඳුන්වා දෙන ලදී.

(ආ) රජයේ ආදායම ...................... හා ...................... ආදායම ලෙස වර්ග කළ හැක.

**33.** (අ) සීමිත පෞද්ගලික සමාගමක අවම අධ්‍යක්ෂවරු සංඛ්‍යාව ............................ ක් වන අතර සීමිත පොදු සමාගමක අවම අධ්‍යක්ෂවරු සංඛ්‍යාව ...................... ක් වේ.

(ආ) වෙන්වෙන්ව පැවති සමාගම් දෙකක් හෝ කිහිපයක් තනි ව්‍යාපාරයක් බවට පත් වීම ...................... වන අතර එක් සමාගමක් අනෙක් සමාගමේ කොටස් ප්‍රාග්ධනයෙන් වැඩි ප්‍රමාණයක් මිලට ගැනීම ...................... කර ගැනීම වේ.

**34.** (අ) කොටස් වෙළෙඳපොළේ සුරකුම්පත් වල ...................... තුළින් සෘජු හා වක්‍ර ...................... ලැබේ.

(ආ) සමාගම සතුව පවතින ...................... ප්‍රාග්ධනය බවට පත් කිරීම සංචිත ...................... වේ.

**35.** (අ) වෘත්තීය ආරවුලක් සම්බන්ධව ......................... දෙපාර්ශවය අතර සාමූහිකව ...................... ඇති වේ.

(ආ) විද්‍යුත් යතුරු ලියනය ...................... දත්ත සැකසුම් උපකරණයක් වන අතර විද්‍යුත් .........දත්ත සැකසීමේ තාක්ෂණික ක්‍රමයකි.

**36.** (අ) කිසියම් විශේෂිත විෂයය ක්ෂේත්‍රයකට අදාළව ......................කිරීමට කළමනාකරුවෙකුට ඇති හැකියාව ...................... කුසලතා ලෙස හඳුන්වන අතර

(ආ) ......................... කටයුතු සමඟ සම්බන්ධවන නිසා ...................... මේවා වැඩි වශයෙන් අවශ්‍ය වේ.

**37.** (අ) ආයතනයක වැඩකටයුතු සිදුවන ......................... විචලනයන් ......................ක්‍රියාමාර්ග ගැනීම.

(ආ) ........................ ලෙස එය හඳුන්වන අතර .........................දී එය සිදු වේ.

**38.** (අ) සංවිධානයන්හි කාර්යය ඉටු කිරීමට අවශ්‍ය ........................... ලබා දීම සම්පත් ........................... යනුවෙන් අදහස් වේ.

(ආ) වෙන් වූ වැඩ ඒකකවල කාර්ය හා අරමුණු ...................... කිරීමේ ක්‍රියාවලිය ......................... නම් වේ.

**39.** (අ) භාණ්ඩයකට ........................... ලබාදීම සඳහා ................................ යොදනු ලබයි.

(ආ) භාණ්ඩයක් හෝ සේවාවක් ................................ මගින් පාරිභෝගිකයා ලබන ......................... වෙනුවෙන් හුවමාරු කිරීමට කැමති වටිනාකම මිල ලෙස හඳුන්වයි.

**40.** (අ) ස්වාභාවය අනුව තොරතුරු ........................... හා ............................... ලෙස වර්ග කළ හැකිය.



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

(ආ) .................................පද්ධතියක් මගින් දත්ත තොරතුරු බවට පත් කෙරේ. මෙය ................................. කි.

**අංක 41 සිට 50 තෙක් ප්‍රශ්න වලට සුදුසු පිළිතුරු දී ඇති හිස්තැන් මත ලියන්න.**

**41.** තොරතුරු තාක්ෂණයේ දියුණුව සමඟ ව්‍යාපාර ක්ෂේත්‍රයේ ඇති වූ ප්‍රවණතා හතරක් ලියන්න.

(1) ..........................................................................................................................

(2) ..........................................................................................................................

(3) ..........................................................................................................................

(4) ..........................................................................................................................

**42.** පාරිභෝගික ආරක්ෂණය සඳහා කටයුතු කරනු ලබන ආයතන හතරක් ලියන්න.

(1) ..........................................................................................................................

(2) ..........................................................................................................................

(3) ..........................................................................................................................

(4) ..........................................................................................................................

**43.** 2007 අංක 07 දරණ සමාගම් පනත අනුව සමාගමක් ලියාපදිංචියට ඉදිරිපත් කළ යුතු ලියවිලි හතරක් ලියන්න.

(1) ..........................................................................................................................

(2) ..........................................................................................................................

(3) ..........................................................................................................................

(4) ..........................................................................................................................

**44.** විද්‍යුත් මුදල් කාඩ්පත් මගින් ගනුදෙනු කිරීමට යොදා ගනු ලබන පහසුකම් හතරක් ලියන්න.

(1) ..........................................................................................................................

(2) ..........................................................................................................................

(3) ..........................................................................................................................

(4) ..........................................................................................................................

**45.** නිදහස් වෙළෙඳාමට බලපාන තීරු බදු නොවන බාධා හතරක් ලියන්න.

(1) ..........................................................................................................................

(2) ..........................................................................................................................

(3) ..........................................................................................................................



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources

(4) ..............................................................................................................................

**46.** ගබඩාවක තොගය අවම තොග මට්ටමට වඩා පහළ ගියහොත් ව්‍යාපාරයකට අත්විඳීමට සිදු වන ප්‍රතිඵල හතරක් සඳහන් කරන්න.

(1) ..............................................................................................................................

(2) ..............................................................................................................................

(3) ..............................................................................................................................

(4) ..............................................................................................................................

**47.** හොඳ සන්නමක පැවතිය යුතු ගුණාංග හතරක් සඳහන් කරන්න.

(1) ..............................................................................................................................

(2) ..............................................................................................................................

(3) ..............................................................................................................................

(4) ..............................................................................................................................

**48.** වැඩ වර්ජන නිසා ආර්ථිකයට වන අහිතකර බලපෑම් හතරක් ලියන්න.

(1) ..............................................................................................................................

(2) ..............................................................................................................................

(3) ..............................................................................................................................

(4) ..............................................................................................................................

**49.** තොරතුරු තාක්ෂණයේ ප්‍රතිලාභ හතරක් ලියන්න.

(1) ..............................................................................................................................

(2) ..............................................................................................................................

(3) ..............................................................................................................................

(4) ..............................................................................................................................

**50.** මානව සම්පත් සැලස්මක ඇතුළත් විය යුතු කරුණු හතරක් ලියන්න.

(1) ..............................................................................................................................

(2) ..............................................................................................................................

(3) ..............................................................................................................................

(4) ..............................................................................................................................



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
## Sabaragamuwa Provincial Department of Education

**අවසාන වාර පරීක්ෂණය - 2026 - 13 ශ්‍රේණිය**

**Final Term Test – 2026 – Grade 13**

**ව්‍යාපාර අධ්‍යයනය - II**
**Business Studies - II**

**32 S II**

කාලය } පැය තුනයි
*Time* } *Three hours*

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි.**
**Additional Reading Time - 10 Minutes**

උපදෙස් :

- එක් කොටසකින් ප්‍රශ්න දෙක බැගින් තෝරා ගෙන,අවම ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

---

**01.** කමල් විසින් ගෘහ භාණ්ඩ නිෂ්පාදනය කර අලෙවි කරන ආයතනයක් කේ.එච්.ෆර්නිචස් නමින් මොරටුව ප්‍රදේශයේ පවත්වාගෙන යන අතර දිවයින පුරා ශාඛා දහයක පමණ ඔහුගේ නිෂ්පාදන අලෙවි කරයි. මෙම ව්‍යාපාර ආයතනය සඳහා පක්ෂපාති ගනුදෙනුකරුවන් පිරිසක් ද සිටින අතර දක්ෂ සේවකයන් පන්සීයක් පමණ සේවය කරයි. මෙම ව්‍යාපාරය නවීන මාදිලියේ සුඛෝපභෝගී ගෘහ භාණ්ඩ නිෂ්පාදනය කරන අතර නිෂ්පාදන සඳහා වගකීම් සහතික ලබා දීමත් අදාළ ස්ථානයට ප්‍රවාහනය කර දීමත් සිදු කරයි. එසේම විදේශයන්ගෙන් නවීන ගෘහ භාණ්ඩ ආනයනය කර ඔහුගේ ප්‍රදර්ශනාගාර තුළ අලෙවිකිරීම කරනු ලැබුවත් ගෝලීය යුධ වාතාවරණය හේතුවෙන් එම භාණ්ඩ ආනයනය මෙන්ම මිල කිරීමේ ගැටලුද මතුවිය.

**i.** (අ) කමල්ගේ ව්‍යාපාර ආයතනය මගින් සපුරාලන්නේ මිනිස් අවශ්‍යතාවකි. ඔබ එකඟ වන්නේද? පිළිතුරට හේතුව ලියන්න. (ල.2)

(ආ) පාරිභෝගිකයන් තෘප්තිමත් කිරීම සඳහා කමල් විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග හතරක් ලියන්න. (ල.2)

**ii.** කමල්ගේ ව්‍යාපාරය පහත නිර්ණායක මත වර්ග කර දක්වා ඊට හේතුව පැහැදිලි කරන්න.

(අ) පරිමාණය අනුව (ල.2)

(ආ) හිමිකම අනුව (ල.2)

**iii.** (අ) ව්‍යාපාරයක ප්‍රධාන කටයුතු දෙක නම් කර සිද්ධිය ඇසුරින් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල.2)

(ආ) ඉහත ව්‍යාපාරයේ අවස්ථාවක් හා තර්ජනයක් ලියන්න. (ල.2)

**iv.** (අ) ඉහත ව්‍යාපාරය කෙරෙහි බලපෑම් ඇති කරනු ලබන ආසන්න හා සාර්ව පරිසර සාධක දෙක බැගින් ලියන්න. (ල.2)

(ආ) කමල්ගේ ව්‍යාපාරය හරහා සමාජයට ඉටුකළ යුතු සමාජ වගකීම් හතරක් ලියන්න. (ල.2)

**v.** (අ) මෙම ව්‍යාපාර ආයතනයට පාරිසරික තිරසර බව තහවුරු කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග දෙකක් ලියන්න. (ල.2)

(ආ) මෙම ව්‍යාපාර ආයතනය ආර්ථිකය සංවර්ධනයට දායක වන ආකාර දෙකක් සිද්ධිය ඇසුරින් දක්වන්න. (ල.2)



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

**02.** මායා ඇපරල් නමින් මාලනී විසින් සේවකයන් දස දෙනෙකු යොදා ගෙන ඇගලුම් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යයි. නිෂ්පාදිත දේශීය වෙළෙඳ පොළට සපයයි. ඇය විසින් ව්‍යාපාරය පුළුල් කිරීමේ අරමුණින් සීමිත පෞද්ගලික සමාගමක් බවට පත් කිරීමට අපේක්ෂා කරයි.

**i.** (අ) මාලනීට රජයේ ආර්ථික අරමුණු ඉටුකර ගැනීමට දායක විය හැකි ආකාර හතරක් සඳහන් කරන්න. (ල.2)

(ආ) ඇයට දිරි ගැන්වීම් ලබා ගත හැකි රාජ්‍ය ආයතන හතරක් නම් කරන්න. (ල.2)

**ii.** (අ) මාලනීගේ ව්‍යාපාරය ලියාපදිංචි කළ යුතුද? පිළිතුරට හේතු ලියන්න. (ල.2)

(ආ) ඇයගේ ව්‍යාපාරය ලියාපදිංචි කිරීමේ ක්‍රියාපටිපාටිය ලියන්න. (ල.2)

**iii.** (අ) මෙම ව්‍යාපාරය ඒක පුද්ගල ව්‍යාපාරයක් ලෙස පවත්වාගෙන යාමෙන් අත්වන ප්‍රතිලාභ හතරක් ලියන්න. (ල.2)

(ආ) "මායා ඇපරල්"ආයතනය සීමිත සමාගමකින් වෙනස් වන ආකාරය කරුණු හතරක් ඇසුරින් ලියන්න. (ල.2)

**iv.** (අ) වරලත් ගිවසුමක් යන්න අර්ථ දක්වා එහි ඇතුළත් කරුණු හතරක් ලියන්න. (ල.2)

(ආ) වරලත් ව්‍යාපාර ක්‍රමය මගින් වරලත් හිමියාට අත්වන වාසි දෙකක් හා සීමා දෙකක් සඳහන් කරන්න. (ල.2)

**v.** (අ) රාජ්‍ය සංස්ථාවක ලක්ෂණ හතරක් ලියන්න (ල.2)

(ආ) ශ්‍රී ලංකා විදුලි බල මණ්ඩලය නව ආයතන හතරක් යටතේ ප්‍රතිව්‍යුහගත කිරීම මෑතකදී රජය ගත් ක්‍රියාමාර්ගයකි. (ල.2)

රජය එසේ සිදු කිරීමෙන් ඉටු කිරීමට අපේක්ෂා කරනුයේ කුමක්දැයි කරුණු දෙකක් ඇසුරින් දක්වන්න. (ල.2)

**03. i.** (අ) ගෝලීය ව්‍යවසායකත්වය යන්න හඳුන්වන්න. (ල.2)

(ආ) ගෝලීය ව්‍යවසායකත්වයට එරෙහිව ඇති අභියෝග දෙකක් දක්වන්න. (ල.2)

**ii.** චමිත් සිය රැකියාවෙන් ලද ජුනි මස වැටුපෙන් රු.60,000ක් යොදවා ජංගම දුරකථනයක් මිලදී ගැනීමත් රු.10,000 ක් යොදවා බැංකු ණය වාරිකය ගෙවීමත් රු.16,000 ක් යොදවා නිවසේ කුලිය ගෙවීමත් රු.10,000 ක් බැංකුවේ තැන්පත් කිරීමක් සිදු කරන ලදී.

(අ) මුදලේ කාර්යයන් දෙකක් නම් කර සිද්ධිය ඇසුරින් උදාහරණ ලියන්න. (ල.2)

(ආ) ඉහත සිද්ධිය ඇසුරින් හඳුනා ගත හැකි මුදල් වර්ග දෙකක් නම් කර කෙටියෙන් පැහැදිලි කරන්න. (ල.2)

**iii.** (අ) බලපත්‍රලාභී වාණිජ බැංකු හා බලපත්‍ර ලාභී මුදල් සමාගම් අතර වෙනස් කම් දෙකක් ලියන්න. (ල.2)

(ආ) කොටස් තැරැව්කාර සමාගම් වල කාර්යයන් හතරක් ලියන්න. (ල.2)

**iv.** දැහැමි සේනානායක යන අයට රු.15000 ක මුදලක් ගෙවීම සඳහා චෙක්පතක් ලිවිය යුතුව ඇත. ඇයගේ බැංකු ගිණුම රත්නපුර මහජන බැංකු නගර ශාඛාවේ පවතී.



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

(අ) ඉහත චෙක්පත ලිවීමේදී අනුගමනය කළ හැකි ආරක්ෂිත ක්‍රමවේද හතරක් ලියන්න. (ල.2)

(ආ) චෙක්පතක් පිටසන් කිරීම යන්න හඳුන්වා පිටසන් කළ යුතු අවස්ථා දෙකක් සඳහන් කරන්න. (ල.2)

v. ලක්මාල් හට හිමිකාරීත්වය ඇති නුවරඑළියේ පිහිටි තේ කර්මාන්ත ශාලාව රුපියල් ලක්ෂ දහය බැගින් ආයතන හතරක රක්ෂණය කර ඇතත් කර්මාන්තශාලාවට සිදුවූ රු.ලක්ෂ පහක හානිය සඳහා ආයතන හතරෙන්ම ලද වන්දි මුදල රුපියල් ලක්ෂ පහකි.

(අ) ඉහත සිද්ධියට අදාලවන රක්ෂණ මූලධර්මය දක්වා වන්දි හිමිවීමට බලපෑ හේතුව කෙටියෙන් පැහැදිලි කරන්න. (ල.2)

(ආ) ලක්මාල් හට ලබා ගත හැකි වෙනත් රක්ෂණ ඔප්පු හා එම රක්ෂණාවරණ ලබා ගත හැකි අවස්ථා හතරක් දක්වන්න. (ල.2)

**04. i.** ආයතනය සේවකයින් සඳහා පවත්වනු ලබන එක්දින ධාරිතා සංවර්ධන වැඩ සටහන සඳහා 2026 අගෝස්තු මස 05 වන දින තම අංශවල සියලු සේවකයින් සහභාගී කරවන ලෙස සියලු කළමනාකරුවන්ට ප්‍රධාන විධායක නිළධාරී විසින් ලිපියක් මඟින් දැනුම් දෙන ලදී. ඒ සඳහා අදාළ කටයුතු සුදානම් කළ බව කළමණාකරුවන් විසින් ලිපියකින් ප්‍රධාන විධායක නිළධාරී වෙත දැනුම් දෙන ලදී.

ඉහත සිද්ධිය ඇසුරින් සන්නිවේදන ක්‍රියාවලියේ මූලිකාංග නම් කර උදාහරණ ලියන්න. (ල.4)

**ii.** නිසි කලට ප්‍රවාහනය වෙළෙඳාමේ ව්‍යාප්තියටත් පුද්ගලයින්ගේ පැවැත්මටත් ඉවහල් වේ.

(අ) ප්‍රවාහනය ව්‍යාපාර- සඳහා හා ආර්ථිකයට වැදගත්වන ආකාර දෙක බැගින් ලියන්න. (ල.2)

(ආ) ගබඩාවක් ස්ථානගත කිරීමේ දී සලකා බැලිය යුතු කරුණු හතරක් ලියන්න. (ල.2)

**iii.** (අ) ප්‍රවාහන හා සැපයුම් සේවාවල ප්‍රයෝජන හතරක් ලියන්න. (ල.2)

(ආ) ගෝලීය රටවල පවතින යුධමය තත්ත්වය ව්‍යාපාර ක්ෂේත්‍රයට ඇති කරනු ලබන බලපෑම ප්‍රබලය. එය කරුණු දෙකක් ඇසුරින් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල.2)

**iv.** ගේලීය වශයෙන් රටවල් විදේශ වෙළෙඳාමෙ නියැලීම අත්‍යවශ්‍ය කරුණකි.

(අ) විදේශ වෙළෙඳාමට පදනම් වී ඇති සාධක හතරක් ලියන්න. (ල.2)

(ආ) ණයවර ලිපිය විදේශ වෙළෙදාම සඳහා වැදගත් වන්නේ කෙසේදැයි ලියන්න. (ල.2)

**v.** (අ) විදේශ වෙළෙඳාමේ ප්‍රවණතා හතරක් ලියන්න. (ල.2)

(ආ) විද්‍යුත් වෙළෙඳාම මගින් ව්‍යාපාරිකයින්ට හා ගනුදෙනුකරුවන්ට අත්වන වාසි දෙක බැගින් ලියන්න. (ල.2)

## II කොටස

**05. i.** කළමනාකරණය යනු ගතික ව්‍යාපාර පරිසරය තුළ සංවිධානයක ප්‍රකාශිත පරමාර්ථ, අරමුණු සඵලදායීව ඉටුකර ගැනීම සඳහා සංවිධානය සතු සම්පත් කාර්යක්ෂමතාවයෙන් යුතුව සැලසුම්කරණය, සංවිධානකරණය, මෙහෙයවීම හා පාලනය යන කාර්යය ඇතුළත් සඵලදායි ක්‍රියාවලියකි.



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

(අ) මෙම නිර්වචනය තුළ ඇතුළත් සංකල්ප හතරක් පැහැදිලි කරන්න. (ල.2)

